

පන්හිඳට
පණ ඇවිත්
පී.බී.කේ. ඇලකුඹුර

# පන්හිඳට පණ

# ඇවිත්

කතෘ

## පී.බී.කේ. ඇලකුඹුර

කතෘ : **පී.බී.කේ. ඇලකුඹුර**

ISBN No : 978-624-208-130-4
දිනය : 2023/11/15.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023.11. 01

## පිදුම

ආත්ම විශ්වාසය

ගොඩනගා දී

අභිමානය පෙරදැරිව

ජීවිතය ජීවත් කරවන්නට

කියා දුන්

ළඟ නැතත්

හැම වෙලේම  කඳුලගින්

දෙනෙත තෙමන සෙනෙහස

රැන්දූ

ආරදණීය

දෙමාපියන්ට

## <u>තුති පිදුම</u>

අරමුණක් නැතිව

ඉබාගාතේ ගිය හිත

නැවතත් කවියකට ළං කර

මා සංවේදී කර

කවි සිත පුබුදුවාලූ

මහාමායා බාලිකා විදුහලේ

විදුහල්පතිනිය,

නියෝජ්‍යප විදුහල්පතිනියන්ට සහ

සහකාර විදුහල්පතිනියන්ට

## අඳ වීම

දැනෙනවා හැමතැනම

ඇහෙනවා නිතරම

පෙනී නොපෙනී යනවා

සිත ළඟම දැවටෙනවා

කිසිදාක නොසිදෙන ආශාවක් නිතරම සිත තුළ

දකින්නට ඇහෙන්නට දැනෙන්නට ඒ සෙනෙහස

බොහෝ දුරයි මා ඔබෙන්

කිසිදාක ළං නොමවග ලෙස

ඒත්................

වෙන්ව ගියදා පටන්

ළඟයි හැම මෙහොතකම හදවතේ

රිදුම් දී අම්මේ................

සොයමි ඔබේ සෙනෙහස

අඳ වූ විලස අඳ

**<u>සෙනෙහස</u>**

පායා එන තරුවක

මුමුණ මුමුණ කියන

සෙනෙහසේ කවි සින්දු

තව කුමට ගයන්නද

නුඹ ළඟ ඉඳියි නම්

රස විඳිනු මිස ජීවිතය

කවි සින්දු එපා මට

**<u>ජීවිතය</u>**

ජීවත්කරවන්නට

කාගෙන්වත් අවැසි නෑ

හැර මිටි

ගසා ගණන් උඹේ කොඳු කාරටියට

මුක්කු

නැගිටලා බලහන්

ආයෙත් කවදාවත්

කාටවත්

වට්ටන්න බැරි බව

නුඹව..................

දැනෙයි

නුඹටම ..................

**<u>දිසාපාමොක්</u>**

වීදි සරණ ළියේ නුඹ

හැඩ වැඩට ගියත් අද

පොත් අතර සිටිය ඒ

සාමලා අමරලා

අදත් මුණ ගැහෙනවාද?

කියා දුන් ජීවිතය

ඔබෙන් මග හැරුණාද

කාසි නැති ජීවිතය

අරුමයකැයි කියා

ඒ පොතේ කිසිතැනක

ලියැවිලා තිබුණාද

වැරදුනේ අපට දැයි

නුඹට දැයි

කවුරුවත් ඇසුවාද?

## <u>වෙනස</u>

අතු පතර විහිදිලා

මහා වෘක්ෂය

විරාජමානව

වැජඹෙනවා .....................

බලා ඉන්නට බැරිව

මුදලාලි

ඉරනවා කොටනවා

ගනිනවා බලනවා

හුස්ම දුන් ජීවිතය

වැතිරිලා බිම ඉකිබිදිනවා

අමරණීය

සල්ලි එක්ක

ගනුදෙනුව නිමා කර

වට පිටේ ඇස් යවා

තවත් ගත් හොයන විට

හුස්ම ගන්නට බැරිව

මච්බිමට ණය වෙලා

මුදලාලි මැරෙනවා .........................

**<u>මලක මහිම</u>**

පහළ අත්තේ පිපුණු මල් ටික

හිනැහි හිනැහි වට්ටියට විත්

සැරසෙන විට

ඉහළ අත්තේ උඩින් පිපි මල්

මානයෙන් සරදමට ඔච්චම්

කළත් ..........................

එකට පිපිලා බුදුන් දැකලා

මල් අසුනේ වැදුම් ලබන විට

දුටුවාමානයත් දෝතින් දරාගෙන

ඉහළ පිපි මල පරව

ගස මුලට විත් වැතිරුණා

**<u>නොදන්නා බව නොදත් බව</u>**

උනුන් කොටවා නසන

සිත් සතන් අවුලුවා

ඒ ගින්න දෙස බලා

මගුල්බෙර පලු ගසන

මිනිසුනේ.......................

ඉපදුනේ මරණයත් අතින් ගෙන

බව

නුඹලාට අමතකද?

**<u>මානය</u>**

නම උඩවැඩියා

වුනත්

උඩගුකම හොඳ නෑ

උඩවැඩියා මලේ....................

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලිකවළ යෝජනාවක් ලෙස පාසල්

දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01